# චින්තනය සහ ගැටළු විසඳීම
# Thinking & Problem Solving

මහාචාර්ය ඥානදාස පෙරේරා
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

චින්තනය හෙවත් සිතීම සාමාන්‍ය ව්‍යවහාරයෙහි දක්නට ලැබෙන්නේ ගුප්ත දෙයක් වශයෙනි. බාහිර පරිසරය අමතක කොට දමා නිශ්චල ව සිටිමින් කල්පනා කිරීම චින්තනය යයි සාමාන්‍ය මිනිසුන් පිළිගනී. එහෙත් මනෝවිද්‍යාත්මක අර්ථයෙන් චින්තනය යනු මෙයට වඩා වෙනස් දෙයකි. ශාරීරික වශයෙන් ක්‍රියාකාරී වෙමින් වුව ද චින්තනයේ යෙදෙන්නට පුළුවන. අනෙක් අතට යමක් පිළිබඳ සිතනවා යයි කී විට සිතනු ලබන දේ පිළිබඳ මූර්තීන් සිතේ මවා ගන්නේ යයි විශ්වාස කෙරේ. එහෙත් මූර්ති වලින් තොර ව සිතීමට පුළුවන. මෙසේ බලන විට මනෝවිද්‍යාත්මක වශයෙන් චින්තනය යනු පුද්ගලයෙකුට පිටතින් නිරීක්ෂණය කළ නොහැකි ගුප්ත දෙයක් ලෙස නොසැලකේ. **චින්තනයේදී සිදුවන්නේ අපගේ මධ්‍ය ස්නායු පද්ධතිය බාහිර සංඥාවන් කෙරෙහි ප්‍රතිචාරය නතරවීමය.** ජීවියා සිතනවාද නැද්ද යන්න ඔහුගේ බාහිර චර්යා ඇසුරින් නිරීක්ෂණය කළ හැකි බව චර්යාවාදී මනෝවිද්‍යාඥයින් පවසති. චර්යාවාදි මනෝවිද්‍යාඥයෙකු වන වොට්සන් පවසන අන්දමට **චින්තනය යනු හඬ නොනැගෙන සේ කථා කිරීමකි.** අනෙක් අතට මනෝවිද්‍යාත්මක වශයෙන් අප චින්තනය යන වචනය භාවිත කරන්නේ නිශ්චිත සරල සංකල්පයකට නොවේ. එය ඔහු රූපිත සංකල්පයකි. චින්තනය යන වචනයට අයත් විවිධ මානසික චර්යාවන් සමූහයක් ඇත. ගැටළු විසඳීම, නිර්මාණ චින්තනය, තර්කනය, සංකල්ප සාධනය, පරිකල්පනය ආදි සියල්ල චින්තනයට අයත් වේ. මෙසේ චින්තනය විවිධ කොටස්වලට බෙදුනේ එම සෑම එකක්ම

උත්තේජන සහ ප්‍රතිචාර අතර සිදුවන ක්‍රියාවලියක් බැවින් පොදු ලක්ෂණයෙන් යුක්තය. නිදසුනක් වශයෙන් ඉගෙනුම සම්බන්ධ ප්‍රජනන මතයේදී චිම්පන්සියා කෙසෙල් ඇවරිය කූඩුව තුළට ගත් ආකාරය සලකා බලමු. මෙහිදී උත්තේජනය කෙසෙල් ඇවරියයි. ප්‍රතිචාරය කෝටුවෙන් එය කූඩුව තුළට ඇදගැනීමයි. මේ දෙක අතර එක්තරා ක්‍රියාවලියක් සිදු වී තිබේ. එය චින්තනයයි. චර්යාවාදීන් දක්වන අන්දමට චින්තනය යනු උත්තේජක ප්‍රතිචාර අතර මද්‍යගත ක්‍රියාවලියක් වීම හැරුනු විට මාංශ පේශිවල වෙනස්වීමක් ලෙසද සලකනු ලැබේ. මෙම අදහස් ඉදිරිපත් කරන ලද්දේ ජේ.බී. වොට්සන් විසිනි. විවිධ ආවේගයන් පවතින විට මාංශ පේශිවල වෙනස්වීම විවිධ අන්දමින් සිදුවේ. කෙනෙක් සිටින්නේ කෝපයෙන්ද, ප්‍රීතියෙන්ද, නැතහොත් කනගාටුවෙන්ද යන වග ශාරීරික ප්‍රතික්‍රියා ඇසුරින් දැක ගත හැකියැයි පිළිගැනේ. එහෙත් මනෝ විශ්ලේෂණවාදීන් හා ගෙෂ්ටෝල්ට්වාදීන් මෙම මතය පිළිගන්නේ නැත. චින්තනය මුලුමනින්ම <u>මාංශ පේශින් මගින් පමණක් පැහැදිලි කළ නොහැකි බව ඔවුන් පවසයි.</u> එමනිසා පුද්ගලයාගේ අභ්‍යන්තර ලක්ෂණ ද බැලිය යුතුයයි ඔවුහු පවසති. මෙය කුමක් වුවත් චින්තනය යනු උත්තේජන හා ප්‍රතිචාර අතර සිදුවන මධ්‍යගත ක්‍රියාවලියකි යන අදහස පිළිගැනීමට සිදු වේ. චින්තනය හා සම්බන්ධ විවිධ අවස්ථාවන් වෙන් වශයෙන් සලකා බලමු.

## ගැටළු විසඳීම

" යම්කිසි උත්තේජනයක් නිසා ජීවියා තුළ ඇති වන්නා වූ නිෂ්ඨාව කලින් උපාර්ජනය කළ ප්‍රතිචාරයෙන් සරල ලෙස යොදා ගැනීමෙන් ලබා ගත නොහැකි නම් එය ගැටළුවක් වෙයි."

මෙබඳු අවස්ථාවකදී ජීවියා විසින් එකී ගැටළුව විසඳන්නේ කෙසේද යන්න මනෝවිද්‍යාත්මක වශයෙන් මතුවන ප්‍රශ්නයකි. ගැටළු විසඳීම සම්බන්ධයෙන් ඉදිරිපත් වන ප්‍රධාන මත 3 ක් තිබේ.

1. ආවර්ථන ක්‍රමය
2. තැත් වැරැදි ක්‍රමය
3. ප්‍රතිවේදය

ආවර්ථන ක්‍රමය යනු අප මුලින් උගත් ප්‍රතිචාරයක් වැඩිදුර වැරැදි





නොසිතා අළුත් උත්තේජනය සම්බන්ධයෙන් නැවත යොදා ගැනීම එකී ක්‍රමය මගින් ඇතැම් විට ගැටළුව විසදා ගනී. තැත් වැරැදි ක්‍රමය යනු වැරැද්ද වැරැද්ද කිරීමෙන් යම් අවස්ථාවක ගැටළුව විසදා ගැනීමයි. මෙය ඉදිරිපත් කරන ලද්දේ චර්යාවාදීන් විසිනි.

ප්‍රතිවේදී මතයෙන් ඉදිරිපත් වන්නේ තැත් වැරැදි ක්‍රමයට විරුද්ධවය. මිනිසුන් වැනි දියුණු ජීවීන් බොහෝ අවස්ථාවලදී ගැටළු විසඳන්නේ වරද්දා වරද්දා කිරීමෙන් නොවන බව පොෂ්ටෝල්ට් වාදීහු පවසති. ඔවුන් පවසන පරිදි අප ගැටළු සඳන්නේ ක්‍ෂනිකව අප තුළ ඇති වන ප්‍රජාතන ශක්තිය නිසාය. ඉතිහාසය දෙස බලන විට අපට එබඳු සාධක දක්විය හැක. ඇතිවිසස්ගේ පරිමාව හා ස්කන්ධය ගැටළුව අයිසැක් නිව්ටන්ගේ ගුරුත්වාකර්ෂණ පිළිබඳ ගැටළුව ආදි ගැටලු ඔවුන් විසදා ඇත්තේ ක්‍ෂනිකවය. එමනිසා තැත් වැරැදි ක්‍රමය ප්‍රතිවේද මතය පිළිගන්නවුන් විසින් ප්‍රතික්ෂේප කර ඇත. එහෙත් චර්‍යා වාදීන් මෙයට පිළිතුරක් වශයෙන් ඉදිරිපත් කරන්නේ අපගේ අතීත අත්දැකීම් ප්‍රතිවේදයේදී උපකාරී වන බවයි. සමහර ගැටළුවලට පිළිතුරු හැම එකක්ම ලැබුනා සේ පෙනුනත් ඒවා පිළිබඳ අපි ඥානීතව සිතමින් සිටිනවා විය හැක. එමනිසා නිතරම ගැටළුව විසදෙනවා යයි කීම සිතීමේ නිවැරැදි ක්‍රමය නොවේ. ජීවියෙකු ගැටළුවක් විසඳෙන විට ඒ සඳහා බලපානු ලබන සාධක 2 ක් තිබේ.

### (1) අභිප්‍රේරණය

ගැටළු විසදීමේදී අදාළ ගැටළුව පිළිබඳ පුද්ගලයා තුළ යම් ඕනෑකමක් තිබිය යුතුය. උදාහරණයක් වශයෙන් ඇල්බට් අයින්ස්ටයින් හට ඔවුහුගේ සාපේක්ෂතා මතය ඉදිරිපත් කිරීම සඳහා අභිප්‍රේරණය ඇති වුයේ අවුරුදු 16 දී පමණ බව සඳහන් වේ. කුතුහලය, සාධන චේතනාව ආදි අභිප්‍රේරණයන් මෙයට අයත් වේ.

(2) **නිර්මාන චින්තනය**

අපගේ චින්තනය ආශ්‍රිත තවත් ක්‍රියා වලියක් නම් නිර්මාන චින්තනයයි. කලාකරුවන් විද්‍යාඥයින්, ඉංජිනේරුවන් නිර්මාන චින්තනයේ යෙදේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් අළුත් දෙයක් බිහිවේ. නිර්මාන චින්තනයෙහි යුක්ත පුද්ගලයන් සෙසු පුද්ගලයන්ට වඩා වෙනස් අය වන්නේ චර්යාවන් නිරීක්ෂණය කිරීමෙන්ය. මෙම දත්තයන් අනුව කෙනෙකුගේ නිර්මාන චින්තනය සිදුවන්නේ පියවර කිහිපයක් ඔස්සේ බව පෙනේ. යම්කිසි නිර්මානයක් යනු එකි තත්වවල අවසානයයි.

(1) සූදානම්වීම
(2) බීජ අවස්ථාව
(3) ගවේෂනය
(4) අගය කිරීම
(5) සකස් කිරීම

පළමු අවස්ථාවේදී සිදුවන්නේ ගැටළුව කුමක්දැයි තේරුම් ගෙන එයට කරුණු සෙවීමයි. උදාහරණයක් වශයෙන් ඇපල් ගෙඩිය වැටෙනු දුටු නිව්ටන් එයට හේතුන් සෙවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන පිළිතුරු චායා මාත්‍රයක් වශයෙන් සිතෙහි ගොඩ නැඟේ. එය දෙවන අවස්ථාවයි. අදාළ පිළිතුර ක්ෂනිකව මතු වන්නේ තුන්වන අවස්ථාවේදීය. එසේ සොයාගත් දෙය කෙතෙක් දුරට නිවැරදිද එහි අඩුපාඩුකම් මතු වන්නේ තුන්වන අවස්ථාවේදීය. එසේ සොයාගත් දෙය කොතෙක් දුරට නිවැරැදිද එහි අඩුපාඩුකම් මොනවාද ආදී දෙවල් තීරණය වන්නේ හතරවන අවස්ථාවේදීය. නිර්මාන පරිපූර්ණ වුවක් ලෙස ඉදිරිපත් වන්නේ පස්වන අවස්ථාවේදීය. නිර්මාන චින්තනයේදී මෙම අවස්ථා සියල්ලම හෝ කිහිපයක් හෝ පසු කිරීමට සිදු වේ.

මනුෂ්‍යාගේ නිර්මාන චින්තනයට තදින්ම බලපාන සාධකයක් නම් අභිප්‍රේරණයයි. සිග්මන් ෆ්‍රොයිඩ් පවසන අන්දමට සාමාජික හෝ සංස්කෘතික හේතුන් නිසා අපගේ සමහර ආශාවන් අවරෝධනය කිරීමට





සිදු වේ. චින්තනය මැවෙන්නේ මෙසේ අවරෝධනය කරන ලද ආශා නිසාය. බලාපොරොත්තු කඩවූ විට හෙවත් ඉච්ඡා භංගත්වයට පත් වූ විට අපට ඇති වන්නේ අධික කාන්සාවකි. ( Anxiety) මෙය මඟ හරවා ගැනීමට අපගේ යටිසිත අහම්බෙන් භාවිතා කරන උපක්‍රම ආරක්ෂන යන්ත්‍රන යනුවෙන් හඳුන්වයි. මෙකී ආරක්ෂන යන්ත්‍රන අතර එකක් නම් " උත්කර්ශනයයි " බිඳවැටෙන අපේක්ෂාවන් වෙනත් අතකට යොමු කිරීමෙන් තමන්ගේ ක්ෂේත්‍රය තුළ විශිෂ්ඨත්වයට පත් වීම මඟින් කාන්සාව මඟහරවා ගැනීම උත්කර්ශනයේදී සිදුවේ. විද්‍යාඥයින්ගේ කලාකරුවන්ගේ නිර්මාන කෙරෙහි උත්කර්ෂණය උපකාරී වේ.

## සංකල්ප සාධනය

සංකල්පයක් යනු විවිධ අවස්ථාවන්ට හා විවිධ වස්තූන්ට පොදු වූ ලක්ෂණයයි. මෙයද චින්තනයේ කොටසකි. උදාහරණයක් වශයෙන් හුනු කැටය යයි කී විට එය සංකල්පයකි. අනෙකුත් සංකල්පයන්ගෙන් හුනු කැටය වන සංකල්පය හඳුනාගන්නේ එයට අයත් පොදු ලක්ෂණ හඳුනා ගැනීමෙනි.

පොදු ලක්ෂණ නිසා සිලින්ඩරාකාර බව, කැඩෙන බව ආදිය එහි පොදු ලක්ෂණ වේ. එගි එක් හුනු කූරක් හුනුකූරක් බවට හඳුනා ගන්නේ මෙකී පොදු ලක්ෂණ නිසාය. සංකල්ප යනු එයයි. චින්තනයට සහ අදහස් හුවමාරු කිරීමට මිනිසාට සංකල්ප අවශ්‍ය වේ. ඇතැම් විට සමහර සංකල්ප සරල සංකල්ප වේ. සරල යයි කී මෙන් අදහස් වන්නේ නිශ්චිත පොදු ලක්ෂණ වලින් වෙන් කර ගැනීමේ හැකියාවයි. උදාහරණ ලෙස ත්‍රිකෝණය යන්න සංකල්පයකි. එහෙත් භාෂාවේ ඇති සමහර සංකල්ප සංකීර්ණය. මේ ලක්ෂණ එකවර හඳුනා ගත නොහැකිවේ. "මනස", "පරාජය" වැනි සංකල්ප සංකීර්ණ සංකල්පයන්ය.

තාර්කික චින්තනයේදීද මෙකී සංකල්ප පිලිබඳ අවබෝධය වැදගත් වේ. යම් සංකල්පයකට අයත් පොදු ලක්ෂණ අපැහැදිලි වූ විට එය අර්ථ නිරූපනය කිරීම අපහැදිලි වේ. මේ නිසා සංකල්ප පිළිබඳ අවබෝධය චින්තනයේ දී අවශ්‍ය කරයි. චින්තනයේ දී යොදා ගන්නා මෙකී සංකල්පය මනෝවිද්‍යාත්මක වශයෙන් ප්‍රධාන කොටස් තුනකට බෙදේ.

(1) සංයෝජක සංකල්පය

(2) වියෝජක සංකල්පය

(3) සම්බන්ධතා සංකල්පය

සංයෝජක සංකල්ප යනු පොදු ලක්ෂණ සමූහයක් මගින් අවබෝධ කරගන්නා සංකල්පයයි. ලක්ෂණ සමූහයක එකතුව තුළින් එවැනි සංකල්පයක් තනා ගනී. උදාහරණයක් වශයෙන් මේ සය යන සංකල්පය අප හඳුනා ගන්නේ විවිධ මේස වල පවතින පොදු ලක්ෂණ ඇසුරිනි.

වියෝජක සංකල්ප යනු වියතුන්ගේ එකිනෙකට වෙනස් ගති ලක්ෂණ උපයෝගී කර ගෙන සංකල්ප තේරුම් ගැනීමයි. උදාහරණයක් වශයෙන් කුඩා ළමයෙකුට හුණු කූරක් පෙන්වා එය හුණුකූර වශයෙන්ද පැන්සලක් පෙන්වා එය පැන්සල වශයෙන්ද හඳුන්වා දුන් විට එක් එක් වස්තුවේ වෙනස්කම් ඇසුරින් මෙකී වස්තූන් අයත් වන සංකල්පය ළමයා හඳුනා ගනී.

සම්බන්ධතා සංකල්ප යනු එක් එක් වස්තූන් අතර පවතින සම්බන්ධතා පදනම් කර ගෙන ගොඩ නැගෙන සංකල්පයන්ය. (ඒ) සහ (බී) වස්තූන් දෙකක් නම් සහ (ඒ) නිසා (බී) රැඳී පවතී නම් එහිදී (ඒ) සහ (බී) අතර සම්බන්ධය හේතුඵල සම්බන්ධය යන්වෙන් හඳුන්වයි. එවිට හේතුඵල සම්බන්ධය යන්න සම්බන්ධතා සංකල්පයකි. චින්තනයෙහි සංකල්පයන් ප්‍රකාශයට පත් කරන මාධ්‍ය භාෂාවයි. එහෙත් දැනට මනෝ විද්‍යාඥයින් කරන ලද සම්පරීක්ෂණ අනුව භාෂාවක් නොමැති සංකල්පය පිළිබඳ හැඟීම ඇති කළ හැකි බව සොයා ගෙන ඇත. මිනිසෙකුට ත්‍රිකෝණයක් පමණක් සිතන්නට සැලස්වීමෙන් අනෙකුත් වස්තූන් හා ත්‍රිකෝණ අතර වෙනස පිළිබඳ අවබෝධය ඇති කර වීමට හැකි වී තිබේ. එහෙත් මිනිසා සම්බන්ධව සංකල්ප පවතින්නේ භාෂාව ඇසුරින්ය. මෙකී සංකල්ප සාධනය සඳහා කීං සහ මෝර්ගන් යන මනෝ විද්‍යාඥායින් විසින් ක්‍රමයක් පෙන්වා දී තිබේ.

**(1) විභේදන ඉගෙනීම**

සංකල්ප සාධනය වන එක් ක්‍රමයක් නම් විභේදන ඉගෙනුමයි. විභේදන ඉගෙනුම යනු උත්තේජන අතර වෙනස තේරුම් ගැනීමයි. අප බොහෝ සම්පත් ඉගෙන ගන්නේ විභේදන ක්‍රමය මගිනි.





**(2) සන්දර්ශන භාවිතය**

යම් වස්තුවක් යෙදෙන සන්දර්ශනයන් හඳුනා ගැනීමෙන් එකී වස්තුව මා සම්බන්ධ සංකල්ප තේරුම් ගැනීම සන්දර්ශනයයි. X යනු ලිවීමට ගන්නා උපකරණයකි. X වලින් ලියූ පසු ලියූ දේවල් ඉක්මනින් නොමැකේ. X අඟල් 5 හෝ 6ක දිගින් යුක්තය. වියලි ද්‍රව්‍යවලින් තනා තිබේ. මෙසේ සන්දර්ශන ඉදිරිපත් කළ පසු එයින් ඇතිවෙන සංකල්ප මොකක් දැයි තේරුම් ගමු. වෙනත් ලෙසකින් කීවොත් එකී සන්දර්ශනයට අයත් වස්තුව සමාන වර්ගයක් අයත් ඒවා බව අවබෝධ කර ගැනීමයි.

**(3) නිර්වචනය**

කිසියම් වස්තුවකට අයත් ලබන හෙවත් ගුණාර්ථයන් ඉදිරිපත් කිරීමෙන් එකී වස්තුව අයත් වන සංකල්පය පිළිබඳ අවබෝධ කර ගත හැකි වේ. නිර්වචනය සඳහා යොදා ගන්නා වස්තුවක සනය හෝ ජාතිය පිළිබඳ නිර්වචන යයි.

**(4) වර්ගීකරණය**

සංකල්ප හඳුනා ගැනීමේදී එක් එක් වස්තුවක් අයත් වර්ග ප්‍රභේද කොට හඳුනා ගැනීම වර්ගීකරණයයි. උද්භිද විද්‍යාව, ජීව විද්‍යාව ආදී විෂයයන් සංකල්ප හඳුනා ගන්නේ වර්ගීකරණය ඇසුරිනි. මෙකී ක්‍රම ඇසුරින් යම් සංකල්පයක් ඉගෙනීමේදී ඒ සඳහා බලපාන මනෝවිද්‍යාත්මක සාධක මොනවාද මේ සම්බන්ධයෙන් බලපාන එක් සාධකයක් නම් " පුහුණු මාරුවයි " එනම් යම් සංකල්පයක් කලින් උගත් පසු එයට සමාන සංකල්ප තේරුම් ගැනීමට පහසු වේ. මෙය පුහුණු මාරුව වේ. විහිතය යනුද මෙය වෙයි.

අනෙක් සාධකය නම් වස්තූන්ගේ පවතින විශේෂත්වයයි. එක් එක් වස්තූන්ගේ පවතින සුවිශේෂ මත සංකල්ප තේරුම් ගැනීම සිදුවේ. අනෙක් සාධකය නම් සංයුක්ත බවයි. සංජානනීය ලෝකය හා සම්බන්ධ සංකල්පයන් සාධනය කිරීම පහසුය. ව්‍යුක්ත සංකල්පය හෙවත් ව්‍යවහාරික ජීවිතයෙන් බැහැර සංකල්ප තේරුම් ගැනීම අපහසුය. කුඩා ළමයෙකුට හැන්දක් සහ ත්‍රිකෝණයක් පෙන්වුවොත් ළමයා පහසුවෙන් හැන්ද නමැති සංකල්පය තේරුම් ගනී.

# තාර්කික චින්තනය

තර්ක ශාස්ත්‍රයෙහි තාර්කික චින්තනය යනු සප්‍රමාණ ආකාරයයෙන් යුත් චින්තන නියමයන්ට අනුව සිතීමයි. එහෙත් මනෝ විද්‍යාත්මක අර්ථයෙන් තාර්කික චින්තනය යනු එබඳු නීතිරීති සමූහයකට අනුව සිතීම නොවේ. මෙය පැහැදිලි කිරීම සඳහා මෝර්ගන් විසින් මෙබඳු නිදර්ශනයක් ඉදිරිපත් කරයි. " අපි කුඩා ළමයෙකුගෙන් මෙසේ ප්‍රශ්න කරමු. අවුරුදු 06 ක හැම ළමයෙක්ම පාසැලේ ඉන්නවා. කුඩා ජොනීටත් අවුරුදු 06 යි. එසේ නම් ජොනී ඉන්නේ කොහිද මෙහිදී ළමයා මට පාසැල පෙනෙන්න බැහැ හෝ මම පාසැල පිළිකුල් කරනවා වැනි පිළිතුරක් දීමට පුළුවන." මනෝ විද්‍යාත්මක අර්ථයෙන් මෙම පිළිතුර තාර්කිකය. ප්‍රශ්න කරුගේ ප්‍රශ්නය නමැති උත්තේජනයට දක්වන ප්‍රතිචාරය ඒ සඳහා දෙන පිළිතුර වේ. මේ නිසා මනෝ විද්‍යාත්මක වශයෙන් ජොනීගේ පිළිතුර ඔහුගෙන් ඇසූ ප්‍රශ්නය නමැති උත්තේජනයට දක්වූ ප්‍රතිචාරයකි. මනෝ විද්‍යාවේ සලකා බලන්නේ තාර්කික චින්තනය පිළිබඳ නීති රීති නොව ඒවා කෙරෙහි බලපාන හේතු සාධකයන්ය. තාර්කික චින්තනයක් අවශ්‍ය වන්නේ අපට ඇති වන සමහර ගැටළු විසඳීමට බාධා ඇති වූ විටය. වෙනත් ලෙසකින් කිවහොත් ප්‍රශ්නයේ ඇති සංකීර්ණතාව නිසාය.

තාර්කික චින්තනය කෙරෙහි බලපාන අනෙක් සාධකය නම් අභිප්‍රේරණයයි. අප සමහර ක්‍රියාවලදී සාධාරණීකරණය කරති. සාධාරණීකරණය යන්න සිදු වූ වරදක් නිවැරදි සේ දැක්වීමයි. මේ සඳහා අපි මනෝ විද්‍යාත්මක වශයෙන් විවිධ තාර්කික චින්තන ක්‍රම අනුගමනය කරමු. මෙසේ ගැටළුවේ සංකීර්ණ බව සහ අභිප්‍රේරණ වල බලපෑම තාර්කික චින්තනයට බලපාන හේතූන් වේ.

චින්තනය පිළිබඳ මෙකී විවිධ අවස්ථාවන් ගොනු කර බැලීමේදී ඒ සම්බන්ධව මතයන් 02 ක් ඉදිරිපත් වේ. එයින් පළමු වන මතය ඉදිරිපත් කර ඇත්තේ ජේ.බී. වොට්සන් විසින්ය. එකී මතය " පරියත්ත මතය" නමින් හඳුන්වයි. ජීවියා සිතනවාද නැද්ද යන්න ඔහුගේ බාහිර සාධක ඇසුරින් මැනගත හැකි බව එම මතයෙන් කියවේ. විද්‍යුත් උපකරණ ඇසුරින් ඒ අවස්ථාවන් නිරීක්ෂණ කෙරේ. එම නිසා චර්යාවාදීන්ට අනුව සිතීම යනු හඬනොනගා කථා කිරීමයි. එහෙත් දෙවන මතයෙන් කියැවෙන්නේ චින්තනය මාංශ පේශින් ඇසුරින් නිරීක්ෂණය කළ නොහැකි බවයි.





චින්තනයේදී ඇතැම් විට මාංශ පේශින්ගේ ප්‍රතික්‍රියාවන් සිදු වීමට පුළුවන. එහෙත් ඇතැම් අවස්ථාවල පේශිමය ප්‍රතික්‍රියා වලින් තොරව චින්තනය සිදුවිය හැකිය. අනෙක් අතට පේශිමය ප්‍රතික්‍රියා යනු චින්තනය නිසා ඇති වන්නක් නොව චින්තනය සමඟ එකවර ඇති වන දෙයකි. එහෙයින් ජීවියා සිතනවාද නැද්ද යන්න අධ්‍යනය කළ හැක්කේ බාහිර නිරීක්ෂණයෙන් නොව අන්තරාව ලෝකන ක්‍රමය හෙවත් පුද්ගල මනස තුළට යොමා බැලීමෙන්ය. මෙකී මත අතරින් මනෝ විද්‍යා ක්ෂේත්‍රයේ වැඩි වශයෙන් පිළිගැනෙන්නේ චර්යාවාදීන්ගේ මතයයි. ගිල්බට් රයිල් නමැති දාර්ශනිකයා විවිධ හේතු සාධක දක්වමින් චින්තනය ශාරීරික ප්‍රතික්‍රියා ඇසුරින් තීරණය කළ හැක්කක් බව පවසයි.